# කාන්ටියානු සෞන්දර්ය දර්ශනය, උපමා භාවිතය හා පරමාදර්ශවාදය (ධම්මපදය ඇසුරෙනි)

සුනිල් වික්‍රමසිංහ[1]

බටහිර බුද්ධි ප්‍රබෝධයේ ආරම්භයත් සමග බාහිර ලෝකයේ පැවැත්ම අධ්‍යයනය කිරීම සඳහා නව එළඹුම් රාශියක් සංස්ථාපනය විය. විද්‍යාව හා දර්ශනය ලෝකයෙහි වාස්තවික පැවැත්ම කෙරෙහි මූලික අවධානය යොමු කරන විට කලාව බාහිර සෞන්දර්ය අධ්‍යයනය කිරීමට මූලික අවධානයක් යොමු කළ ආකාරයක් පෙනේ. ඉමැනුවෙල් කාන්ට් 'සෞන්දර්ය' පිළිබඳව දක් වූ මූලික සංකල්පය තත් විෂය හා බද්ධ වෙයි. අප බාහිර දේවල් පංචේන්ද්‍රියන් මගින් ග්‍රහණය කරගෙන, ස්මෘති පරිකල්පනය මගින් අවබෝධ කොට ගෙන එහි රසය වින්දනය කරයි. එම වින්දනය 'නියම ආකාරයෙන් සිදුවේද? '' යන කාරණය සෞන්දර්ය පිළිබඳ 'පරමාදර්ශවාදී' සංකල්පයෙන් ප්‍රශ්න කරන්නකි. මේ වන විට තත්කාලීන සමාජය තුළ සංස්ථායිතාවට පත්ව තිබූ සාධ්‍යතාවාදයට හා විද්‍යාවට පිළිතුරක් වශයෙන්ද ඔහු සෞන්දර්ය පිළිබඳ රස සංකල්පය ඉදිරිපත් කරයි. මූලිකව ඔහු රස සිද්ධාන්තය විග්‍රහ කර ඇත්තේ ඒක පුද්ගල භාවය මත ඇති වන විශ්වීය සත්‍යයක් ප්‍රකාශනය වන දෙයක් වශයෙනි. බාහිර පරිසරය වින්දනය කිරීම සියල්ලටම පොදු සර්වකාලීන වටිනාකමකින් යුක්ත වූවකි. එහෙත් වින්දනය කිරීමේ හැකියාව විවිධය. එය පරිකල්පනය, තේරුම් ගැනීම හා බහුත්වය මත ඇති වන්නකි. කිසියම් පුද්ගලයෙකු රසයෙහි අවසාන ඵලය වශයෙන් භුක්ති විඳිනුයේ කිසියම් සුන්දර වස්තුවක් දැක, එය සුන්දර බව ග්‍රහණය කොට ලබාන්නා වූ ස්මෘතිගත ධාරණාවට අනුවය. ඒ නිසා රස පරමාදර්ශී වීමට නම් නිශ්චිත සූත්‍රගත ධාරිතාවකට එය යටත් විය යුතු අතරම එය පුද්ගල බද්ධද විය යුතුය.

කාන්ට්ගේ සෞන්දර්ය පිළිබඳ මෙම න්‍යාය පසුකාලීන සාහිත්‍ය න්‍යාය හා නිර්මාණ සඳහාද පසුබිමක් විය. විශේෂයෙන් නිර්මාණයක 'උපමා භාවිතය' තුළින් සෞන්දර්යාස්වාදයෙහි පරමාදර්ශී භාවය ඇති වන බවද ප්‍රකාශ විය. එසේම සෞන්දර්ය රසය තීව්‍රමය චමත්කාරයට පත් කරන්නට උපමා හේතු වන බවද ප්‍රකාශ විණි. අප මෙම පර්යේෂණ පත්‍රිකාව මගින් අරමුණු කරන්නේ කාන්ට්ගේ න්‍යාය තුළ සාකච්ඡාවට ලක් වන සෞන්දර්ය සංකල්පය ධම්මපදය තුළ සංගෘහිතව ඇති ආකාරයට අධ්‍යයනය කිරීමය. එම ගාථාවල සංගෘහිත උපමා උපයුක්ත වීමෙන් එහි සෞන්දර්ය රසය ද්විගුණාකාර වන අයුරු සාකච්ඡාවට ලක් කිරීමටය. ධමමපද ගාථාවල සංගෘහිත උපමා තුළ දර්ශනික අර්ථයට අමතරව සෞන්දර්ය අර්ථයක් තිබේද යන කාරණය සන්දර්භය හා පසුබිම වශයෙන් උපයුක්ත කර ගන්නා ලදි. ඒ සඳහා අවශ්‍ය දත්ත පුස්තකාලය සමීක්ෂණය යටතේ රැස් කරගන්නා ලද අතර සෞන්දර්ය පිළිබඳ ඇති මූලික සංකල්ප ඇසුරෙන් අදාළ දත්ත විශ්ලේෂණය කරන ලදි.

**ප්‍රමුඛ පදඃ** සෞන්දර්ය, පරමාදර්ශවාදය, උපමාව, ධම්මපදය, සාධ්‍යතාවාදය

1 සහාය කථිකාචාර්ය, ශාස්ත්‍ර පීඨය, සිංහල අධ්‍යයන අංශය, පේරාදෙණි විශ්වවිද්‍යාලය, පේරාදෙණිය
Email: sunilwick2010@gmail.com ,